**දඹුල්ල ප්‍රාදේශීය සභාව - 2020**

---------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

දඹුල්ල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට දඹුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයපථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගනන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන ප්‍රතිපාදනවලින් මිලදී ගෙන ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබූ රු.203,988 ක යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, ලී බඩු සහ සවිකිරිම් අගය ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කරනොතිබුණි. | පෙන්වා දී ඇති අඩුපාඩුව පිළිගන්නා බව ප්‍රාග්ධන වියදම් නිශ්චිතව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව | වත්කම්නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළස්ථිර තැන්පත්පොලී ආදායම රු.124,657 ක් අඩුවෙන් දක්වා තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති අඩුපාඩුව පිළිගන්නා බවත් ඉදිරිවර්ෂයේ ගිණුම් සෑදීමේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව | ආයෝජන ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 02 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.27,073,950 ක් හා උපලේඛන / වාර්තා අනුව වටිනාකම රු.9,020,967 ක් වූයෙන් රු.18,052,983 ක වෙනසක් විය. | නිරවුල් කිරීමට කටයුතු කරමින් සිටින බව. | වෙනස්කම් හඳුනාගෙන අදාළ ගැලපීම් සිදු කළ යුතු වීම. |

### 1.6.3 අවිනිශ්චිත ගිණුම්

| විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පසුගිය වර්ෂයේ අවසානයට තිබුණු අවිනිශ්චිත ගබඩා ගිණුමේ රු.12,587,598 ක් වූ හර ශේෂය සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් නොකර ඉදිරියට ගෙනවිත් තිබුණි. | ගබඩා භාණ්ඩ නිකුත් කිරීම් දීර්ඝ කාලයක් තිස්සේ ගිණුම්ගත නොකිරීම නිසා මෙම ශේෂය ඉදිරියට ගෙනඑමින් පවතින අතර කමිටුවක් පත්කර එම වාර්තාව අනුව ඉදිරි කටයුතු කරන බව. | අවිනිශ්චිතශේෂයහඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතු වීම. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.38,066,493 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් සඳහා අවශ්‍ය උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වසරේ ගිණුමෙන් නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව | සාක්ෂි සහිතව වත්කම් පවත්වා ගත යුතු වීම. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | වසර 02 ඉක්ම වූ එකතුව රු.1,500,527 ක් වූ කර්මාන්ත, ටෙන්ඩර් හා වෙනත් තැන්පත් ශේෂ 23 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වසර දෙකට වැඩි තැන්පත් මේ වන විට ආදායමට ගැනීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.13,675,398 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.34,171,896 ක් විය. ප්‍රාග්ධන ආදායම සියයට 88 කින් හා පුනරාවර්ථන ආදායම සියයට 25 කින් අඩුවීමත් වැටුප් හා දීමනා ගෙවීම් සියයට 06 කින් වැඩිවීම මීට හේතු ලෙස නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුව විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවේ අනුමැතිය නොමැතිව සීගිරිය නව රථගාල තුළ පුද්ගලයෙකු විසින් වෙළඳකුටියක්ද පදිංචිය සඳහා කුඩාකුටියක්ද ඉදිකර ඇති අතර එම ඉදිකිරීම සම්බන්ධයෙන් 2016 වර්ෂයේ සිට සභාව විසින් අදාළ පුද්ගලයින් වෙත දැනුම්දීම් සිදුකර තිබුණද එම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති අනවසර ඉදිකිරීම ඉවත් කරන බව | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | වසර 07 කට වැඩි කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.4,005,495 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 06 ක වටිනාකම (හිඟහිටි වෙනත් ආදායම් රු.1,153,546 , අගරු චෙක් රු.13,050 , කුලී පාලන රු.1,000 , නගර සභාව - දඹුල්ල රු.2,806,009 , ජංගම ගිණුම - 31313 , නිලධාරි ණය 577) නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ලැබිය යුතු ශේෂයන් අය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව පාවිච්චි කරනු ලබන ට්‍රැක්ටරය, ටේලරයද, කැබ් රථය යන වාහන වල අයිතියද ප්‍රාදේශීය සභාවට අයත් සුසාන භූමි, ප්‍රජාශාලා, මහජන පුස්තකාල හා ක්‍රීඩා පිටි ඇතුළු ඉඩම් කට්ටි 112 කට අයත් ඉඩම් ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනිමට අවශ්‍ය කටයුතු කල යුතු වේ. ඒ අනුව වාහන පවරා ගැනීමට ඒවා අයිති ආයතන වලට දන්වා ඇති බවත් ඉඩම් පවරා ගැනීමට අදාළ කටයුතු ප්‍රාදේශීය ලේකම් සමඟ අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව නිරීක්ෂණය විය. | පවරාදීමටකටයුතුකරනමෙන්අදාළආයතනයන්ටදන්වා ඇති අතර ඉඩම් පවරා ගැනිමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව | වත්කම්වල අයිතිය තහවුරු කර ගැනීමට ක්‍රියා කළ යුතු වීම. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකමුතු ගොවි සමිතිය වෙත රු.135,000 ක සිට රු.1,000,000 ක් දක්වා පරාසයක කොන්ත්‍රාත් 30 ක් විටින් විට ප්‍රදානය කර තිබුණද ගිවිසුම් තබන අවස්ථාව වන විට සමිතිය සතු මූල්‍ය හැකියාව රු.10,792 සිට රු.745,512 දක්වා පරාසයක විය. කර්මාන්ත 06 කට කොන්ත්‍රාත් පිරිනැමීමේදී මූල්‍ය හැකියාව පරික්ෂා කර නොතිබුණි. | මෙම කොන්ත්‍රාත් පිරිනමන ලද සමිති වලින් දීර්ඝ කාලයක් තිස්සේ සංවර්ධන වැඩ ඉටු කර තිබීම හා එම කටයුතු නිසි ආකාරව ඉටු කර තිබීම හා පෞද්ගලිකව දන්නා බැවින් අදාළ කොන්ත්‍රාත් පිරිනැමූ බව | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.9.1 අනුව අනුමත සමිතියකට එක්වර පැවරිය හැක්කේ රු.මිලියන 2 ක උපරිමයකට යටත්ව කර්මාන්ත 03 ක් පමණි. නමුත් සභාව විසින් 2020 වර්ෂය සඳහා සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ පිරිනමා තිබූ කොන්ත්‍රාත් 44 න් රු.11,614,381 ක් වටිනා කොන්ත්‍රාත් 22 ක් සමිති 03 ක් වෙත පවරා තිබුණි. | පළපුරුදු සංවිධාන එම කොට්ඨාශ වලින්ම තෝරා ගැනීම සිදු වන බැවින් විගණනයේදී පෙන්වා දී ඇති සමිති සඳහා වැඩි කොන්ත්‍රාත් ප්‍රමාණයක් ලබා දීමට සිදුවන බව | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 මාර්ගෝපදේශය නියමයන්ට අනුව කටයුතු කළ යුතු වීම. |